ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் திணைக்களம்
LAND COMMISSIONER'S DEPARTMENT

නො.7, ග්‍රෙගරි මාවත ,කොළඹ 07
இல 7, கிரகரீஸ் மாவத்தை, கொழும்பு 07
No.7 , Gregory's Avenue, Colombo 07

ෆැක්ස් / பெக்ஸ் / Fax : 684051
ඊමේල් / ஈ-மெயில் / E-mail : Landcom@sltnet.lk


මගේ අංකය / எனது இல / MY NO : 5/2/6/රත්නපුර

ඔබේ අංකය / உமது இல / YOUR NO :

දිනය / திகதி / DATE : 2003.09.30

චක්‍රලේඛ අංක 2003/13

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

## ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දීමනාපත්‍ර නිකුත් කිරීම

ඉහත කරුණ සම්බන්ධව මගේ සමාංක හා 2002.01.07 දිනැති 2002/01 දරණ චක්‍රලේඛය මගින් ඉ.කො. 156 ආකෘතියෙන් දීමනා පිළියෙල නොකරන ලෙසට දී තිබූ උපදෙස් මෙයින් අත් හිටුවමි.

ඒ අනුව වහාම ක්‍රියාත්මක වන පරිදි ඉ.කො. 156 ආකෘතිය මගින් දීමනාපත්‍ර පිළියෙල කර මා වෙත එවන ලෙසත්, එහිදී මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද රේඛාචිත්‍රයක් දීමනාපත්‍රය සමඟ අනිවාර්යයෙන්ම එවිය යුතු බවත් කාරුණිකව දන්වා සිටිමි. මෙතෙක් රේඛාචිත්‍ර ලැබී නොමැති නම් එම ඉඩම් සඳහා මගේ සමාංක හා 2003.01.31 දිනැති 2003/02 චක්‍රලේඛය අනුව මැනුම් නියෝග යැවීමට කටයුතු කරන ලෙසත් දන්වමි.

තවද නව දීමනාපත්‍ර සකස් කිරීමේ දී මීට පෙර දීමනාපත්‍ර පිළියෙල කිරීමේ දී උපයෝගී කරගත් 91/03 චක්‍රලේඛයේ සඳහන් ආකෘති පත්‍ර යොදා ගන්නා ලෙසත්, දීමනාපත්‍ර අංකනය කිරීමේ දී අවසන් වරට නිකුත් කරන ලද දීමනාපත්‍ර අංකයේ සිට ඉදිරියට අංකනය කරන ලෙසත් කාරුණිකව දන්වමි.

එස්.ජේ.පතිරණ
ඉඩම් කොමසාරිස්.

පිටපත:-
1. ලේකම්, ඉඩම් අමාත්‍යාංශය. - දැන ගැනීම සඳහා.
2. මැණුම්පති, මැණුම් දෙපාර්තමේන්තුව. - අවශ්‍ය කටයුතු සඳහා
3. සියළුම දිසා ලේකම්වරුන්. - දැන ගැනීම සඳහා.
4. සියළුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන්. - ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් සකස් කරන දීමනාපත්‍ර මා වෙත එවීම සඳහා සහ අවශ්‍ය කටයුතු සඳහා.
5. සියළුම නියෝජ්‍ය/ සහකාර ඉඩම් කොමසාරිස්වරුන්. - අවශ්‍ය කටයුතු සඳහා.